# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන)

**(469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා විසින් 2022 ජනවාරි මස 20 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2021 නොවැම්බර් මස 19 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[100 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

*2 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ දීර්ඝ නාමය ප්‍රතියෝජනය කරනු ලබන අතර සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ විෂය පථය පුළුල් කිරීම වේ.

*3 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ වඳ වී යෑමේ තර්ජනයට ලක් ව සිටින වන සත්ව හා වෘක්ෂලතා විශේෂ ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ සම්මුතිය (CITES) බලාත්මක කිරීම පිණිස නියෝග සෑදීමට අමාත්‍යවරයාට බලය දීම වේ.

එල්.ඩී.—ඕ. 13/2017

**(469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2022 අංක     දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

2. (මෙහි මින්මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන) (469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආඥාපනතේ දීර්ඝ නාමය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන දීර්ඝ නාමය ආදේශ කරනු ලැබේ:— 469 වන අධිකාරයේ දීර්ඝ නාමය ප්‍රතියෝජනය කිරීම

“ශ්‍රී ලංකාවේ වන සතුන් හා වෘක්ෂලතා සහ ඒවායේ වාසභූමි ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා ද; එම වන සතුන් සහ වෘක්ෂලතා සහ ඒවායේ වාසභූමි වාණිජ ලෙස සහ වෙනත් ආකාරයට අනිසි ලෙස ප්‍රයෝජනයට ගැනීම වැළැක්වීම සඳහා ද; ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම සඳහා ද; වඳ වී යෑමේ තර්ජනයට ලක් ව සිටින වන සත්ව හා වෘක්ෂලතා විශේෂ ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ සම්මුතිය (CITES) බලාත්මක කිරීම සඳහා යම් උචිත පියවර ගැනීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද; සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.”.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම

“(ඊඅ) අමාත්‍ය මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමතයට යටත් ව, වඳ වී යෑමේ තර්ජනයට ලක් ව සිටින වන සත්ව හා වෘක්ෂලතා විශේෂ ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ සම්මුතියේ (CITES) විධිවිධාන බලාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලු කාරණා;

(ර්ආ) වඳ වී යෑමේ තර්ජනයට ලක් ව සිටින වන සත්ව හා වෘක්ෂලතා විශේෂ ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ සම්මුතිය (CITES) යටතේ නිකුත් කරනු ලැබිය යුතු යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් නිර්දේශ ලබා ගැනීමේ කාර්යය සඳහා තත්කාර්ය කමිටු පත් කිරීම;”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**4.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.